*සැ. යු.* - 2020.08.28 දින පළ වූ අංක 2,191 දරන *ගැසට් පත්‍රයේ* සහ II හා IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,192 - 2020 සැප්තැම්බර් මස 04 වැනි සිකුරාදා - 2020.09.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1536 | දේපළ විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 1542 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 සැප්තැම්බර් මස 25 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 සැප්තැම්බර් මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## උඩුබද්දාව ප්‍රාදේශීය සභාව

### ගෝ ඝාතක ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ නම් සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයේ 2020 වර්ෂය සිට ගව ඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලා අයදුම්පත් මා වෙත ඉදිරිපත් කර ඇති බවත් එම බලපත්‍රය නිකුත් කිරීම ගැන උඩුබද්දාව ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේනම්, ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන කරුණ සඳහා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් 2කින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළ වූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත එවිය යුතු බවත්, ගෝ ඝාතක ආඥාපනතේ 272 වැනි අධිකාරිය අංක 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එච්. එම්. රාජ් සිසිර කුමාර,<br>
සභාපති,<br>
උඩුබද්දාව ප්‍රාදේශීය සභාව.

2020 ජූලි මස 30 වැනි දින,<br>
උඩුබද්දාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| | *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *ගෝඝාතකාගාරය ඉදි කරනු ලබන ස්ථානය* |
|---|---|---|
| 1. | එම්. එච්. එම්. ඉනාමුල්ලා, දිවුරුම්පොල. | ඒ. එස්. එම්. රිස්මි මයාට අයිති ඇතුන්ගහකොටුව කෝන්ගහමුල්ලහේන්යාය සහ කුලියාපිටිය වත්ත ඉඩම |

09-66

---

## කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව

### 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව විසින් 2020 ජූලි මස 09 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. බී. නිමල් ජයසිරි බණ්ඩාර,<br>
සභාපති,<br>
කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව.

2020 ජූලි මස 22 වැනි දින,<br>
කරුවලගස්වැව දී ය.

**1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 2 වන වගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015.08.31 දින අංක 1930/06 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරනු ලැබූ වයඹ පළාතේ පළාත් සභාව විසින් ස්ථිර කරන ලද 2015.08.31 අංක 1930/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ද ප්‍රාදේශීය සභාවල කාරක සභා ඇති කිරීම, රැස්වීම් පැවැත්වීම, වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම, ආදාහනාගාර විධිමත් කිරීම, පරිපාලනය කිරීම හා ගාස්තු අය කිරීම, අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි කටයුතු පාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය හා ගාස්තු අය කිරීම සඳහා වන සම්මත අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

09-106

## පානදුර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පානදුර ප්‍රාදේශීය සභාව විසින් 2020 ජූලි මස 09 වැනි දින තීරණ අංක 05.1.1 යටතේ මෙහි පහත සඳහන් යෝජනාව සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. හේමන්ත ප්‍රනාන්දු,
සභාපති,
පානදුර ප්‍රාදේශීය සභාව,
වාද්දුව.

2020 ජූලි මස 30 වැනි දින,

ගරු මන්ත්‍රී ක්‍රිෂාන් චමින්ද පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලද යෝජනාව

05.1.1 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වරිපනම් කාර්යය සඳහා යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක සහ හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා හෝ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගා කළ ඉඩමක විශාලත්වය තක්සේරු කිරීම සඳහා ද, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කෙරෙන සංවර්ධන කාර්යයන් සැලසුම් කිරීම පහසු කිරීමත්, 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 3 වන සහ 5 වන වගන්තිවල කාර්යය සඳහා තොරතුරු පද්ධතියක් නිර්මාණය කර ගැනීම සඳහා ද එකී යම්, දේපලක අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුලිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි විශාලත්වය සහ වෙනත් කරුණු පිළිබඳ වාර වාර්තා සපයන ලෙස නියම කළ යුතු යැයි ගරු සභාවට යෝජනා කරමි.

09-61

---

## දික්වැල්ල ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1989 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(I) වගන්තිය ප්‍රකාරව දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ දික්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2018.10.23 වැනි දින පැවති මහා සභා රැස්වීමේ තීරණ අංක 5.19.1 සහ 5.19.2 යටතේ දික්වැල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග වශයෙන් ප්‍රකාශයට පත් කරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල හිමිකරුවන් විසින් හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරෝධතාවයක් පළ නොවුනහොත්, උපලේඛනයේ සඳහන් මංමාවත් දික්වැල්ල ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

කිත්සර මුතුකුමාරණ,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

2020 අගෝස්තු මස 17 වැනි දින,
දික්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| අනු. අංකය | මාර්ගයේ නම | මාර්ගයේ ආරම්භය | මාර්ගයේ අවසානය | මාර්ගයේ දකුණුපස ඉඩම් | මාර්ගයේ වම්පස ඉඩම් | මාර්ගයේ දිග | මාර්ගයේ පළල |
|---|---|---|---|---|---|---|---|
| 01. | සුහද මාවත | ඉහළගොඩ පාර | ඩබ්. එල්. ඒ. ප්‍රියන්ත මහතාගේ ඉඩම | 1. යූ. ඩී. සුනිල් රංජිත් මහතාගේ ඉඩම | 1. ඩී. ඒ. ප්‍රේමදාස මහතාගේ ඉඩම<br>2. ජී. පී. පියදාස මහතාගේ ඉඩම<br>3. මධුෂාන් මහතාගේ ඉඩම<br>4. එම්. කේ. ජයකොඩි මහතාගේ ඉඩම | 70 | 3 |
| 02. | සී. වීව් ගාර්ඩන් මාවත | පියසේන රුවන්පතිරණ මයාගේ ඉඩම | යූ. ජී. ප්‍රේමතිලක මහතාගේ ඉඩම | 1. ඒ. කේ. චන්දිම මධුශංක මහතාගේ ඉඩම<br>2. වනිගසේකර මහතාගේ ඉඩම<br>3. දයාරත්න මහතාගේ ඉඩම | 1. ලක්ෂ්මි නානායක්කාර මියගේ ඉඩම<br>2. එච්. පී. දයාරත්න මයාගේ ඉඩම<br>3. ඒ. පී. ඉඳුනිල් මයාගේ ඉඩම<br>4. සිරිපාල සමරසිංහ මයාගේ ඉඩම | 230 | 3 |

09-107

---

## කයිට්ස් ප්‍රාදේශීය සභාව

### 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1987 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 වසරේ දෙසැම්බර් මස 16 වැනි දින සභා රැස්වීමේ අංක 09 දරන තීරණයට අනුව කයිට්ස් ප්‍රාදේශීය සභාව විසින් පහත සඳහන් තීරණය ගන්නා ලද බව මෙයින් දැනුම් දෙමි.

මරුතයියිනර් ජෙයකාන්තන්,
සභාපති,
කයිට්ස් ප්‍රාදේශීය සභාව,
කයිට්ස්.

කයිට්ස් ප්‍රාදේශීය සභාව,
කයිට්ස්,
2020 ජූලි 17 වැනි දින.

**2019.12.16 වැනි දින අංක 09 දරන තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ උතුරු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරු පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ 2018.10.08 වැනි දින අංක 2092/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* (අති විශෙෂ) කොටසින් ප්‍රකාශයට පත් කරන ලද්ද වූ පළාත් පාලන ආයතන සඳහා අනුමත කරන ලද සම්මත අතුරු

ව්‍යවස්ථා අංක 07 සිට අංක 09 දක්වා වූ පරිච්ඡේද කයිට්ස් ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ ගැසට් පත්‍රයෙන් පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට ඉහත කී 1952 අංක 6 දරන (261 වන අධිකාරිය) සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියට අනුව තීරණය කර සභාවෙන් ඒකමතිකව පිළිගන්නා ලදී.

යෝජනා කිරීම : එම්. ජෙයකාන්තන් මහතා
ස්ථිර කිරීම : කේ. ක්ලැරන්ස් මහතා

09-12/1

---

## කයිට්ස් ප්‍රාදේශීය සභාව

තීරණ අංකය : 05-2020.05.12

සභාවේ JCB වාහනය සඳහා ගාස්තු අය කිරීම පැයට මනු කියවීමට අනුව රුපියල් 2,500.00 ක් වශයෙන් ද, පැය 03 ක් ඇතුළත වන කාර්යය සඳහා කාර්යාලයේ සිට වැඩපළට යාමට සහ වැඩපළේ සිට කාර්යාලයට ඒමටවන ගාස්තු ඇතුළුව අය කරන බවත්, පැය 03කට වැඩිවන කාර්යයන්වලට කාර්යාලයේ සිට වැඩපළට යාමටවන ගාස්තුව සමග අය කරන බවත් තීරණය කර, සභාව විසින් ඒකමතිකව පිළිගෙන ඇත.

යෝජනා කිරීම : කේ. ක්ලැරන්ස් මහතා
ස්ථිර කිරීම : කේ සගාදේවන් මහතා

මරුතයියිනර් ජෙයකාන්තන්,
සභාපති,
කයිට්ස් ප්‍රාදේශීය සභාව,
කයිට්ස්.

කයිට්ස් ප්‍රාදේශීය සභාව,
කයිට්ස්,
2020 ජූලි 17 වැනි දින.

09-12/2

---

## කුරුණෑගල ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ප්‍රාදේශීය සභාව විසින් පහතින් සඳහන් කරන පිඹුරු අංක 2457 යටතේ සඳහන් කොට ඇති මංමාවත කුරුණෑගල ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සළකුණු යොදා ඇති මෙම මංමාවත සම්බන්ධයෙන් අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් විසින් යම් විරෝධතාවක් පළ කරනු ලබන්නේ නම් මේ නිවේදනය පළ වූ දින සිට මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

03. මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් පහත සඳහන් මංමාවත කුරුණෑගල ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් පිළිගෙන පාලනය කරන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ආර්. පී. අචල නිමන්ත වික්‍රමතිලක,
සභාපති,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2020 අගෝස්තු මස 05 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව,
මල්පිටිය -බෝයගනේ.


**වෙහෙරබැන්ද ග්‍රාම නිලධාරී වසමේ බදුවත්ත වෙට්ටාරගොඩ අතුරු මාර්ගය**

| මාර්ගයේ නම | මාර්ගයේ අරම්භය | මාර්ගයේ අවසානය | මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් | මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම් | ග්‍රාම නිලධාරී වසම හා අංකය | මාර්ගයේ දිග | මාර්ගයේ පළල |
|---|---|---|---|---|---|---|---|
| බදුවත්ත වෙට්ටාරගොඩ අතුරු මාර්ගය | වෙහෙර බැන්ද මාර්ගය | ඩබ්. ලලිත් වීරරත්නට හිමිකම් කියන ඉඩම | ඩබ්. එම්. චම්පිකා චාන්දනී | පී. ජී. ටී. පී. සංජීවනී | අංක 808 වෙහෙර බැන්ද | 208 | 3.6 |
| | | | ආර්. පී. ආරියලතා | ඩී. එස්. ඒ. එම්. මාලින් | | | |
| | | | එල්. එම්. එන්සානෝනා | එච්. කේ. එස්. එම්. ඩී. නොනිස් | | | |
| | | | ඒ. එම්. නාමරත්න | ඩබ්. පී. ශ්‍රියානි ප්‍රියන්ති | | | |
| | | | එච්. එම්. ගුණවතී මැණිකේ | ඒ. පී. ජී. මනෝජ් රංගන | | | |
| | | | ඩබ්. ලලිත් වීරරත්න | ඩී. එස්. පතිරාජ | | | |

එම්.ඩබ්ලිව්.ආරියරත්න,
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
මල්ලවපිටිය.
ලියාපදිංචි අංකය 19950421
දුරකථනය:-037-2224639

පිඹුරු අංකය : 2457

## වෙහෙරබැන්ද බදවත්ත වෙට්ටාරගොඩ අතුරු මාර්ගය




පරිමාණය 1:1000

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැළඩවිල්ලි හත්පත්තුවේ තිරගන්දහය කෝරළේ කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාව තුල වෙට්ටාරගොඩ ගමෙහි වෙහෙරබැන්ද බදවත්ත වෙට්ටාරගොඩ අතුරු මාර්ගය (ජයකොඩි මහතාගේ ඉඩමේ බියුර් මහතාගේ ඉඩම සහ ඩබ්ලිව්.ලලිත් වීරරත්න මහතාගේ ඉඩම දක්වාවූ මාර්ගය ) දැනට ඇති මායිම් පරිදි මා විසින් මැන පිළියෙල කරන ලද

පිඹුර

( මුළු දුර මීටර් 208 )

මැනිම කළේ -2019.05.16

එම්.ඩබ්ලිව්.ආරියරත්න
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
මල්ලවපිටිය.
ලියාපදිංචි අංකය 19950421.

# විවිධ දැන්වීම්

## වඩමරාඩ්චි දකුණ බස්නාහිර ප්‍රාදේශීය සභාව

### අනුමැතියක් නොමැති ගොඩනැගිල්ල සඳහා දඩ මුදල් අය කිරීම - 2020

වඩමරාඩ්චි දකුණ බස්නාහිර ප්‍රාදේශීය සභා සීමාව තුළ පූර්ව අනුමැතියක් ලබා නොමැතිව ගොඩනැගිලි ඉදිකළ අය සඳහා දඩ මුදල් 2019.10.24 වැනි දිනැති අංක 66/2019.10.24 දරන සභාවේ තීරණය මත පහත සඳහන් උපලේඛනය අනුව අය කරන බව මෙයින් දැනුම් දෙමි.

ත. අයිංකරන්,<br>
සභාපති,<br>
වඩමරාඩ්චි දකුණ බස්නාහිර ප්‍රාදේශීය සභාව.

ප්‍රාදේශීය සභා කාර්යාලය,<br>
කරවෙඩ්ඩි<br>
2020 අගෝස්තු 11 වැනි දින.

**යෝජනාව**

සීමාව ඉක්මවූ ගොනැගිලි සඳහා දඩ මුදල් 2019.10.14 දිනැති නිවාස කමිටු රැස්වීමේ දී උපලේඛනය අනුව අය කිරීම සඳහා නිවාස කමිටු විසින් නිර්දේශ කර ඇත. මේ අනුව දඩ මුදල් අය කිරීම *ගැසට්* පත්‍රයේ ප්‍රකාශයට පත් කර අය කිරීමට යෝජනාව සම්මත කරන ලදී.

*උපලේඛනය*

| *අනු. අංක* | *අනුමැතියක් නැතුව ඉදි කරන ලද ගොඩනැගිලි විස්තර* | *දඩ මුදල් (රු.)* | |
|---|---|---|---|
| | | *පදිංචි ස්ථාන* | *වෙළෙඳ කටයුතු* |
| 1 | අත්තිවාරම් වැඩ පමණයි (වර්ග මීටර්) | 75 0 | 250 0 |
| 2 | වහල මට්ටම දක්වා (වහල හැර) (වර්ග මීටර්) | 125 0 | 500 0 |
| 3 | වහල ඇතුළත්ව නිර්මාණය (වර්ග මීටර්) | 175 0 | 750 0 |
| 4 | නිර්මාණය සම්පූර්ණ කිරීම (වර්ග මීටර්) | 225 0 | 1,000 0 |
| 5 | මායිම් තාප්පය බැඳීම (මීටර්) | 175 0 | 200 0 |
| 6 | විදුලි සංදේශ හා කාලගුණ ටැඹ (මීටර්) | සෑම මීටර් 5 උස සඳහා 10,000.00 | |

ගොඩනැගිලි අනුමැතිය ලබා එක් වර්ෂයක කාලය තුළ වැඩ අවසන් නොකළ ගොඩනැගිලි සඳහා අතිරේක වර්ෂයක් සඳහා දඩ මුදල් වශයෙන් වර්ග මීටරයකට රු. 75.00 ක් අය කරනු ලැබේ.

09-13/1

---

## වඩමරාඩ්චි දකුණ බස්නාහිර ප්‍රාදේශීය සභාව

### නෙල්ලියඩි නගරයේ ප්‍රධාන මාර්ගවල දෙපැත්තේ වාහන නතර කිරීම තහනම් කිරීම, රියගාල ඉදි කිරීම හා රියගාල භාවිත කරන වාහන සඳහා ගාස්තු අය කිරීම - 2020

උතුරු පළාත් පළාත් පාලන කටයුතුවලට භාරව ඇති අමාත්‍යවරයා විසින් පිළියෙල කර 2016.02.02 දිනැති අංක 1952/16 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* 4(අ) හි පළ කර උතුරු පළාත් සභාව විසින් 2017.02.21 වැනි දින අනුමත කර 2017.03.24 වැනි දිනැති අංක 2011/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ*

4(අ) හි පළ කර ඇති උතුරු පළාත් ප්‍රාදේශීය සභා සඳහා වූ අතුරු ව්‍යවස්ථාවේ 4 වන පරිච්ඡේදයේ II වන වගන්තියේ සඳහන් කර ඇති අතුරු ව්‍යවස්ථාවට අනුකූලව හා මෙම අතුරු ව්‍යවස්ථා පිළිගැනීම සම්බන්ධව වඩමරාඩ්චි දකුණ බස්නාහිර ප්‍රාදේශීය සභාව විසින් 2017.07.07 දිනැති අංක 2027 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ 4(ආ) හි පළකර ඇති තීරණයට අනුව නෙල්ලියඩි නගරයේ ප්‍රධාන මාර්ගවල දෙපැත්තේ වාහන නතර කිරීම තහනම් කිරීම, රියගාල ඉදි කිරීම හා රියගාල භාවිත කරන වාහන සඳහා ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් 2020.06.18 වැනි දිනැති අංක 27/2020.06.18 දරන සභාවේ යෝජනාව සම්මත කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ත. අයිංකරන්,
සභාපති,
වඩමරාඩ්චි දකුණ බස්නාහිර ප්‍රාදේශීය සභාව.

ප්‍රාදේශීය සභා කාර්යාලය,
කරවෙඩ්ඩි
2020 අගෝස්තු 11 වැනි දින.

**රියගාල**

වඩමරාඩ්චි දකුණ බස්නාහිර ප්‍රාදේශීය සභා සීමාව තුළ නෙල්ලියඩි නගරයේ ප්‍රධාන මාර්ගවල දෙපැත්තේ වාහන නතර කිරීම තහනම් කිරීමටත් නෙල්ලියඩි පරණ පොළ පෙදෙසේ රියගාල ඉදි කිරීමටත් එම රියගාල භාවිත කරන වාහන සඳහා පහත සඳහන් උපලේඛනය අනුව ගාස්තු අයකිරිමටත් තීරණය කෙරේ.

**උපලේඛනය**

| | *වාහන විස්තර* | *ගාස්තු (රු.)* |
|---|---|---|
| 1. | පාපැදිය | 5.00 |
| 2. | යතුරු පැදිය | 10.00 |
| 3. | ත්‍රිරෝද රථය | 20.00 |
| 4. | සැහැල්ලු වාහනය | 30.00 |
| 5. | බර වාහනය | 50.00 |

09-13/2

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2020 වර්ෂය** | | | |
| සැප්තැම්බර් | 2020.09.04 | සිකුරාදා | 2020.08.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.09.11 | සිකුරාදා | 2020.08.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.09.18 | සිකුරාදා | 2020.09.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.09.25 | සිකුරාදා | 2020.09.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2020.10.02 | සිකුරාදා | 2020.09.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.10.09 | සිකුරාදා | 2020.09.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.10.16 | සිකුරාදා | 2020.10.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.10.23 | සිකුරාදා | 2020.10.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.10.29 | බ්‍රහස්පතින්දා | 2020.10.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| නොවැම්බර් | 2020.11.06 | සිකුරාදා | 2020.10.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.11.13 | සිකුරාදා | 2020.10.29 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2020.11.20 | සිකුරාදා | 2020.11.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.11.27 | සිකුරාදා | 2020.11.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.